# සංක්ෂිප්තය

පාසල් අධ්‍යාපනය සිසුන්ගේ පෞද්ගලික සංවර්ධනය මෙන්ම රටේ සංවර්ධනයටද හේතු වේ යැයි අපේක්ෂා කෙරේ. බුද්ධිමය, චිත්තවේගීය, හා සමාජයීය අංශ වලින් ශිෂ්‍යයා තුළ විය යුතු සංවර්ධනය ඉටු කිරීම පැවරී ඇත්තේ පාසල මතය. පාසල තම කාර්යය කරනු ලබන්නේ විෂය මාලාව ක්‍රියාත්මක කිරීමෙනි. විෂය මාලාවට ඇතුළත් වන විෂය සමගාමී ක්‍රියාකාරකම් ලෙස හඳුන්වන සම්ප්‍රදායානුකූල පංති කාමර ඉගැන්වීම් ක්‍රියාකාරකම්වලට එක්තරා ප්‍රමාණයකට වෙනස් වූ පරිපාලනමය නැඹුරුවක් සහ සංවිධානමය ස්වරූපයකින් යුත් පාසල මගින් ක්‍රියාත්මක කෙරෙන සියලුම ළමා ක්‍රියාකාරකම්ය. මෙම ළමා ක්‍රියාකාරකම් ආරම්භක නව යොවුන් විය සිසුන්ගේ සමාජයීය අවශ්‍යතා ඉටු කිරීම උදෙසා බලපාන ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ විෂය ක්ෂේත්‍රය වේ.

මෙම පර්යේෂණය මගින් ආරම්භක නව යොවුන් විය සිසුන්ගේ සවභාවය හඳුනාගැනීම, ආරම්භක නව යොවුන් විය සිසුන්ගේ සමාජයීය අවශ්‍යතා විමසා බැලීම, විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා නව යොවුන් විය සිසුන්ගේ සහභාගීත්වය පිළිබඳව සොයා බැලීම, විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සිසුන් දක්වන ආකල්ප හඳුනාගැනීම, විෂය සමගාමී ක්‍රියාකාරකම්වල නියැලීම සඳහා පාසලෙන් ලැබෙන පෙළඹවීම සහ උනන්දුව සොයා බැලීම, සිසුන් සහභාගි වන විෂය සමගාමී ක්‍රියාකාරකම් සමාජයීය අවශ්‍යතා ඉටු කිරීම උදෙසා බලපාන ආකාරය විමසා බැලීම, යන අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කරමි.

මෙම පර්යේෂණ අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහාසිසුන් සහ ගුරුවරුන් වෙත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීම මගින්ද, විදුහල්පතිවරුන් සහ සිසුන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මගින්ද විවිධ පාසල්වලින් දත්ත රැස් කර ගන්නා ලදී. මෙම දත්ත ඇසුරින් ලබා ගත් තොරතරු අනුව පාසලේ විෂය සමගාමී ක්‍රියාකාරකම් ආරම්භක නව යොවුන් විය සිසුන්ගේ සමජයීය අවශ්‍යතා ඉටු කිරීම උදෙසා බලපාන ආකාරය පිළිබඳව විවිධ නිගමන වලට එළඹීමට හැකිවිය. එසේම එම නිගමන ඇසුරින් විවිධ යෝජනා ඉදිරිපත් කරන ලදී.